සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

නාට්‍ය හා රංගකලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..............................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

උපදෙස්:

※ I කොටසෙහි **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

1. ප්‍රාසංගික කලා යන්නෙන්
   (1) සියලු ම ලලිත කලා අදහස් කෙරේ.
   (2) රංගනයෙන්, ගායනයෙන් හා කථනයෙන් කථාවක් ඉදිරිපත් කරන කලාව අදහස් කෙරේ.
   (3) ශ්‍රව්‍ය-දෘශ්‍ය කලා සියල්ල ගම්‍ය වේ.
   (4) ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවී ව ඉදිරිපත් කරනු ලබන ශ්‍රව්‍ය-දෘශ්‍ය නිර්මාණ අදහස් කෙරේ.
   (5) විවිධ ප්‍රසංග මගින් ඉදිරිපත් කරන කලාංග යන අදහස ගම්‍ය වේ. (.........)

2. බැලේ යනු
   (1) විශේෂයෙන් හස්ත හා පාද චලන යොදා ගනිමින් ඉදිරිපත් කෙරෙන කලා නිර්මාණයකි.
   (2) 'මුද්‍රා නාට්‍ය' යනු 'බැලේ' යන්නට සමානාර්ථවාචී නාමපදයකි.
   (3) ශිල්පීන් සම්පූර්ණ ශරීරය ම භාව ප්‍රකාශනය සඳහා යොදා ගන්නා නර්තන ප්‍රභේදයකි.
   (4) ගායනයට හා වාදනයට ප්‍රධාන තැනක් දෙන කලා නිර්මාණ විශේෂයකි.
   (5) විවිධ රංගන හා ගායන ශෛලීන් යොදා ගන්නා කලා මාධ්‍යයකි. (.........)

3. නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය
   (1) පෙරදිග බිහි වූ සංකල්පයකි.
   (2) අංගත්‍රය ම සතර අභිනය මගින් ඉදිරිපත් කෙරේ.
   (3) අංගත්‍රය ම මුද්‍රා නාට්‍යයෙහි යොදා ගැනේ.
   (4) බටහිරින් පෙරදිගට සංක්‍රමණය වූ සංකල්පයකි.
   (5) වචන තුන ම 'නෘත්' ධාතුවෙන් නිෂ්පන්න වී ඇත. (.........)

4. පහත දැක්වෙන කෘති අතුරෙන් පැරණිතම කෘතිය වන්නේ
   (1) භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රය ය.
   (2) ධනංජයගේ දශරූප ය.
   (3) අරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රය ය.
   (4) නන්දිකේශ්වරගේ අභිනයදර්පණය ය.
   (5) රාමචන්ද්‍ර හා ගුණචන්ද්‍රගේ නාට්‍යදර්පණය ය. (.........)

● පහත දක්වෙන මාතෘකා සැලකිල්ලෙන් කියවා, අංක **5** සිට **8** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - නාට්‍ය අධ්‍යක්ෂණය | E - වේෂභූෂණ | I - ආකූලීකරණය |
| B - ප්‍රාප්ත්‍යාශා | F - ෂිතෙ | J - බින්දු |
| C - හකිගකරි | G - ප්‍රයත්න | K - රංගභූමිය |
| D - ප්‍රත්‍යභිඥානය | H - සැමිසෙන් | L - වාග්විලාසය |

5. පොදුවේ නාට්‍යකලාව හා සම්බන්ධ සංකල්ප වනුයේ
   (1) B, C හා D ය. (2) A, E හා K ය. (3) F, G හා H ය.
   (4) H, I හා J ය. (5) C, K හා L ය. (.........)

6. ග්‍රීක නාට්‍යය හා සම්බන්ධ සංකල්ප වනුයේ
   (1) B, E හා L ය. (2) B, D හා L ය. (3) D, I හා L ය.
   (4) A, D හා G ය. (5) D, E හා L ය. (.........)

[ දෙවැනි පිටුව බලන්න.

7. සංස්කෘත නාට්‍යය හා සම්බන්ධ සංකල්ප වනුයේ
(1) A, B හා D ය. (2) B, E හා L ය. (3) B, D හා G ය.
(4) B, G හා J ය. (5) J, K හා L ය. (.........)

8. ජපන් නාට්‍ය කලාව හා සම්බන්ධ වනුයේ
(1) C, D හා E ය. (2) F, G හා H ය. (3) G, H හා I ය.
(4) B, C හා F ය. (5) C, F හා H ය. (.........)

9. ග්‍රීක කොමෝඩියට අයත් ගානවෘන්දයේ ශිල්පීන්ගේ සංඛ්‍යාව
(1) 12 කි. (2) 15 කි. (3) 21 කි. (4) 24 කි. (5) 50 කි. (.........)

- අංක **10** සිට **14** තෙක් ප්‍රශ්නවල, දී තිබෙන ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද යි පහත සඳහන් නම්වලින් තෝරන්න.

A - ෂේක්ස්පියර් B - ධනංජය C - භරතමුනි D - අරිස්ටෝටල් E - ස්ටැනිස්ලාව්ස්කි

10. නාට්‍යය යනු ලෝකයාගේ පැවැත්ම අනුකරණය කිරීමකි.
(1) A (2) B (3) C (4) D (5) E (.........)

11. නාට්‍යයේ අරමුණ ජීවිතය පිළිබිඹු කිරීම ය.
(1) A (2) B (3) C (4) D (5) E( .........)

12. සෑම ආකාරයක ම කලාත්මක ප්‍රකාශනයට පදනම් වී ඇති මූලධර්මය අනුකරණයයි.
(1) A (2) B (3) C (4) D (5) E (.........)

13. නාට්‍යය යනු ජීවිතය පිළිබිඹු කිරීමේ කලාවයි.
(1) A (2) B (3) C (4) D (5) E (.........)

14. අවස්ථාවන් අනුකරණය කිරීම නාට්‍යයයි.
(1) A (2) B (3) C (4) D (5) E (.........)

- පහත දැක්වෙන මාතෘකා හඳුනාගෙන අංක **15** හා **16** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ෆුෂිකදෙන් B - ජෝ.හ.කියු
C - ෂිබයි D - ක්යෝගෙන්
E - හතමිචි F - දන්ජුරෝ
G - ජිදයි මොනො H - කත් අමි කියොත්සුගු
I - ශෙඅමි මොතොකියො J - නක නො අයුමි

15. නෝ නාට්‍යය හා සම්බන්ධ වනුයේ :
(1) CIDGH (2) AEGIJ (3) ADHJE (4) EGHIJ (5) ABDHI (.........)

16. කබුකි නාට්‍යය හා සම්බන්ධ වනුයේ :
(1) ABEGH (2) CEFGJ (3) EFHIJ (4) CDFGH (5) ACEGI (.........)

- අංක **17** සහ **18** ප්‍රශ්නවල **නොගැළපෙන** පිළිතුර තෝරන්න.

17. ගැටුම පිළිබඳ නිවැරදි ප්‍රකාශ :
(1) ගැටුමක් නැති තැන නාට්‍යයක් නැතැ යි යනු බර්නාඩ් ෂෝගේ ප්‍රකාශයකි.
(2) ගැටුම නාට්‍ය නිර්මාණයක් තුළ ගැබ් විය යුතු අනිවාර්ය අංගයකි.
(3) ගැටුම නාට්‍යයකට අත්‍යවශ්‍ය සාධකයක් නොවේ.
(4) ගැටුමක් නිරාකරණය වන අවස්ථාවක් බින්දු නමින් හැඳින්වේ.
(5) බාහිර හා අභ්‍යන්තරික වශයෙන් ගැටුම් අවස්ථා දෙයාකාර වේ. (.........)

18. නාට්‍යය ඉදිරිපත් වන ශෛලියට අනුගත විය යුතු අංග :
(1) වේෂභූෂණ (2) රංග භූමි අලංකරණය
(3) රංගාලෝකනය (4) නාට්‍ය සංගීතය
(5) අංග රචනය
(.........)

- පහත දැක්වෙන්නේ සුප්‍රසිද්ධ කලා නිර්මාණ කිහිපයකි. මේවා උපයෝගී කරගෙන අංක **19** සිට **23** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කරදිය B - දෙපානෝ C - මානසවිල
D - හංසවිල (Swan Lake) E - අපූර් සංසාර්

19. A අකුරෙන් දක්වෙන්නේ
(1) බැලේ නර්තනයකි. (2) ඔපෙරාවකි.
(3) ගීත නාටකයකි. (4) චිත්‍රපටයකි.
(5) මුද්‍රා නාට්‍යයකි.
(.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

20. B අකුරෙන් දක්වෙන්නේ
(1) මුද්‍රා නාට්‍යයකි. (2) ගීත නාටකයකි. (3) ඔපෙරාවකි.
(4) බැලේ නර්තනයකි. (5) චිත්‍රපටයකි. (.........)

21. C අකුරෙන් දක්වෙන්නේ
(1) ඔපෙරාවකි. (2) මුද්‍රා නාටකයකි. (3) චිත්‍රපටයකි.
(4) බැලේ නර්තනයකි. (5) ගීත නාටකයකි. (.........)

22. D අකුරෙන් දක්වෙන්නේ
(1) මුද්‍රා නාටකයකි. (2) ඔපෙරාවකි. (3) චිත්‍රපටයකි.
(4) ගීත නාටකයකි. (5) බැලේ නර්තනයකි. (.........)

23. E අකුරෙන් දක්වෙන්නේ
(1) බැලේ නර්තනයකි. (2) ගීත නාටකයකි. (3) ඔපෙරාවකි.
(4) මුද්‍රා නාටකයකි. (5) චිත්‍රපටයකි. (.........)

- පහත සඳහන් මාතෘකා උපයෝගී කරගෙන අංක **24** සිට **26** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - චාරී
B - විභාව
C - සන්ධිම
D - ස්තම්භ
E - ව්‍යාජිම
F - ස්ථානක
G - හස්ත
H - පුස්ත
I - අනුභාව
J - වේෂ්ටිම
K - කරණ
L - රසික

24. ආංගික අභිනය හා සම්බන්ධ වන්නේ
(1) A, B, C හා D ය. (2) C, E, G හා I ය. (3) A, F, G හා K ය.
(4) F, J, K හා L ය. (5) D, F, H හා J ය. (.........)

25. නාට්‍ය රසය හා සම්බන්ධ වන්නේ
(1) B, D, I හා L ය. (2) D, E, F හා I ය. (3) B, E, H හා J ය.
(4) A, C, D හා E ය. (5) C, D, J හා K ය. (.........)

26. ආහාර්ය අභිනය හා සම්බන්ධ වන්නේ
(1) B, D, G හා I ය. (2) C, E, H හා J ය. (3) A, D, H හා I ය.
(4) E, F, I හා K ය. (5) F, G, J හා L ය. (.........)

- අංක **27** සහ **28** ප්‍රශ්නවල නොගැළපෙන පිළිතුර තෝරන්න.

27. නාට්‍ය පෙළක ස්වභාවය:
(1) සිද්ධීන් තර්කානුකූල ව පෙළගැස්වා තිබීම
(2) සියලු සිද්ධි කාලානුරූපී ව ගොඩනගා තිබීම
(3) නාට්‍යමය ගුණයෙන් යුත් සිද්ධීන්වලින් ගහන වීම
(4) සංවාද මගින් වස්තුව ගොඩනගා තිබීම
(5) රංග විධාන ඇතුළත් ව තිබීම (.........)

28. නාට්‍යධර්මී ලක්ෂණ :
(1) රංගනය ලලිතාභිනයෙන් යුක්ත වීම
(2) රංගනය ලලිතාභිනයෙන් තොර වීම
(3) අවශ්‍යතාව අනුව එක් නළුවකු භූමිකා දෙකක් රඟපෑම
(4) නළුවන් ආත්මගත භාෂණයෙහි යෙදීම
(5) පිරිමි නළුවකු ස්ත්‍රී චරිතයක් රඟපෑම (.........)

- පහත දක්වෙන ප්‍රකාශ ආශ්‍රයෙන් අංක **29** සහ **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ශාපයක් පලදීම නායකයාගේ දුඃඛ ප්‍රාප්තියට හේතු වීම
B - නායක-නායිකාදීන්ගේ ඉෂ්ටාර්ථ සිද්ධිය මස්තකප්‍රාප්ත වීමෙන් නාට්‍යය අවසන් වීම
C - නායකයා අතින් සිදු වන වරදක් නිසා ඔහු දුඃඛ ප්‍රාප්තියට ලක් වීම
D - දුක හා බිය දනවන දර්ශනවලින් අනූන වීම
E - නාට්‍යය නැරඹීමෙන් රසිකයා තුළ රසයක් ජනිත වීම
F - නාට්‍ය වස්තුව හා සම්බන්ධයක් නොමැති ප්‍රස්තාවනාවකින් යුක්ත වීම
G - ප්‍රස්තාවනාව නාට්‍යයට පසුබිම සැපයීම
H - ගද්‍ය සංවාද හා පද්‍ය මිශ්‍ර පෙළකින් රචනා වී තිබීම
I - සම්පූර්ණ නාට්‍ය පෙළ පද්‍යයෙන් රචනා වී තිබීම
J - රචකයාත් අධ්‍යක්ෂවරයාත් එක ම පුද්ගලයකු නොවීම

29. ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ග්‍රීක ට්‍රැජෙඩියට (ශෝකාන්තයට) පමණක් අයත් ප්‍රකාශ වනුයේ
(1) A, B, C, D හා E ය. (2) A, B, E, F හා J ය. (3) A, C, D, G හා I ය.
(4) B, C, E, G හා I ය. (5) A, C, G, H හා I ය. (.........)

e-thaksalawa National e-learning Portal for The General Education

[ හතරවෙනි පිටුව බලන්න.

7428

30. ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සංස්කෘත නාට්‍යයට පමණක් අදාළ ප්‍රකාශ වනුයේ
(1) C, D, F, G හා H ය.
(2) A, C, G, I හා J ය.
(3) C, D, F, H හා I ය.
(4) A, B, G, I හා J ය.
(5) B, E, F, H හා J ය. (.........)

31. ග්‍රීක සටුර නාට්‍ය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රීක සටුර නාටකයක් ට්‍රැජෙඩි තුනක් අවසානයේ දී වේදිකාගත විය.
(2) සටුර නාටකයක් නම් කරනු ලැබුයේ එහි ගානවෘන්දය අනුව ය.
(3) සම්පූර්ණ වශයෙන් සමු වී ඇති එකම සටුර නාටකය කුක්ලොප්ස් නමින් හැඳින්වේ.
(4) එය එව්රිපිඩීස්ගේ රචනයකි.
(5) සටුර නාටක හාස්‍යෝත්පාදක නාටක විශේෂයකි. (.........)

32. 'නාටිකා' පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) 'නාටිකා' යනු පැරණි සංස්කෘත නාට්‍ය ප්‍රභේද දහයෙන් එකකි.
(2) එය අංක හතරකින් සමන්විත නාට්‍ය ප්‍රභේදයකි.
(3) නාටිකාවක් රජ පවුලේ සිද්ධීන් වටා ගෙතී ඇත.
(4) ශෘංගාරය හා හාස්‍යය නාටිකාවක මුඛ්‍ය රස ලෙස හඳුනාගනු ලැබ ඇත.
(5) එහි ගායකයා ධීරලලිත නම් වූ ස්ත්‍රී ලෝල සෙල්ලක්කාර චරිතයකි. (.........)

- පහත දැක්වෙන ප්‍රකාශ ආශ්‍රයෙන් අංක **33** සහ **34** වැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - ❊ ජීවිතය යථාස්වරූපයෙන් ම ගෙනහැර දැක්වීමට උත්සාහ කරයි.
  - ❊ නළුවා වේදිකාව මත කළ යුත්තේ රඟපෑම නොව ජීවත් වීම බව විශ්වාස කරයි.
  - ❊ නළු-නිළි සංවාද සැබෑ ජීවිතයේ ආකාරයෙන් ම ඉදිරිපත් වේ.
  - ❊ රංගභූමිය ද සැබෑ ස්වරූපයෙන් ම සැකසේ.
  - ❊ සැබෑ ද්‍රව්‍ය ම වේදිකාවේ දී භාවිතයට ගැනේ.

33. ඉහත කී ලක්ෂණ ප්‍රකට කරන රංග රීතියේ පුරෝගාමියා වූයේ
(1) හෙන්රික් ඉබ්සන් ය.
(2) සැමුවෙල් බෙකට් ය.
(3) එමිලි සෝලා ය.
(4) ඇන්ටන් චෙකොෆ් ය.
(5) ෂොන් පෝල් සාත්‍රේ ය. (.........)

34. එම රංග රීතිය හඳුන්වනු ලබන්නේ
(1) යථාර්ථවාදී රංග රීතිය යනුවෙනි.
(2) තාත්ත්විකවාදී රංග රීතිය යනුවෙනි.
(3) රෝමාන්තිකවාදී රංග රීතිය යනුවෙනි.
(4) ස්වාභාවිකවාදී රංග රීතිය යනුවෙනි.
(5) ප්‍රකාශනවාදී රංග රීතිය යනුවෙනි. (.........)

35. ග්‍රීක ට්‍රැජෙඩියේ ලක්ෂණයක් **නොවන්නේ**
(1) නාට්‍යපෙළ රචනයේ දී පශ්චාද්-දෘෂ්ටි කථන රීතිය අනුගමනය කර තිබීම ය.
(2) සාත්ත්වික අභිනය මැනවින් යොදාගෙන තිබීම ය.
(3) රංගාලෝකන ක්‍රමයක් නොයොදා ගැනීම ය.
(4) නාට්‍ය දර්ශන තරඟාකාරයෙන් පවත්වනු ලැබීම ය.
(5) බිහිසුණු දර්ශන වේදිකාව මත ඉදිරිපත් නොකිරීම ය. (.........)

36. දැනට ලැබී ඇති සංස්කෘත නාට්‍ය අතුරෙන් වැඩි ම නාට්‍ය සංඛ්‍යාව රචනා කර ඇති කවියා වන්නේ
(1) මහාකවි කාලිදාස ය.
(2) ශ්‍රී හර්ෂ ය.
(3) මහාකවි භාස ය.
(4) රාජශේඛර ය.
(5) භවභූති ය. (.........)

37. 'උන්මත්ත නාට්‍ය' අයත් වන්නේ
(1) ජපාන කබුකි නාට්‍යයට ය.
(2) බුන්රකු නාට්‍යයට ය.
(3) ජනවන්දනා නාට්‍යයට ය.
(4) නෝ නාට්‍යයට ය.
(5) අභූතරූපී නාට්‍යයට ය. (.........)

38. දකුණු පස ඡායාරූපයෙන් දැක්වෙන්නේ



(1) ගුණසේන ගලප්පත්ති ය.
(2) ආර්. ආර්. සමරකෝන් ය.
(3) දයානන්ද ගුණවර්ධන ය.
(4) හෙන්රි ජයසේන ය.
(5) චන්ද්‍රසේන දසනායක ය. (.........)

39. ප්‍රශ්න අංක 38 හි ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුගේ ස්වතන්ත්‍ර නිර්මාණ පමණක් අඩංගු වරණය කුමක් ද?
(1) සිරිබෝ තට්ටුව, කුවේණි, කපුටු බෝ
(2) අපට පුතේ මගක් නැතේ, ජනේලය, කුවේණි
(3) අහස් මාළිගා, අහසින් වැටුණු මිනිස්සු, ජගත් මා
(4) දිරිය මව සහ ඇගේ දරුවෝ, හුණුවටයේ කතාව, මකරාක්ෂයා
(5) නාග ගුරුළා, කැලණි පාලම, අහස් මාළිගා (.........)

40. ප්‍රශ්න අංක 38 හි ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුගේ ම පරිවර්තන/ අනුවර්තන පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අහස් මාළිගා, නාග ගුරුළා, හුණුවටයේ කතාව
(2) දිරිය මව සහ ඇගේ දරුවෝ, ට්‍රෝජන් කාන්තාවෝ, හිත හොඳ අම්මණ්ඩි
(3) හරිම බඩු හයක්, මූදු පුත්තු, අහස් මාළිගා
(4) අහස් මාළිගා, දිරිය මව සහ ඇගේ දරුවෝ, හුණුවටයේ කතාව
(5) නාග ගුරුළා, කපුටු බෝ, දිරිය මව සහ ඇගේ දරුවෝ (.........)

* *

The National e-learning Portal for The General Education

[ හයවෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

නාට්‍ය හා රංගකලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

උපදෙස්:

※ A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

1. (i) 'සෞන්දර්ය' යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි.)*
   (ii) සෞන්දර්යය, කලාවෙන් වෙනස් වන්නේ කෙසේ ද? *(ලකුණු 05 යි.)*
   (iii) කලාවන් අතර 'නාට්‍යය' දරන ස්ථානය සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*

2. (i) 'නාට්‍යධර්මී' යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? *(ලකුණු 04 යි.)*
   (ii) නාට්‍යධර්මී ලක්ෂණ සතර අභිනයෙහි ප්‍රකට විය හැකි අන්දම පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි.)*
   (iii) සංස්කෘත නාට්‍යයක දක්නට ලැබෙන නාට්‍යධර්මී ලක්ෂණ පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි.)*

3. (i) ප්‍රාසංගික කලාවන්හි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කවරේ ද? *(ලකුණු 04 යි.)*
   (ii) ප්‍රාසංගික කලා ගණයට අයත් වන කලා ප්‍රභේද පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 05 යි.)*
   (iii) චිත්‍රපටය ප්‍රාසංගික කලා නිර්මාණයක් ද? ඔබේ පිළිතුර කරුණු දක්වමින් සනාථ කරන්න. *(ලකුණු 06 යි.)*

## B කොටස

4. (i) නූතන යථාර්ථවාදී නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමීන් ලෙස සැලකෙන නාට්‍යකරුවෝ දෙදෙනා කවරහු ද? *(ලකුණු 04 යි.)*
   (ii) ඔවුන්ගෙන් **එක්** නාට්‍යකරුවකුගේ නාට්‍ය කෘති මගින් ඉදිරිපත් කෙරෙන සමාජ යථාර්ථය පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 05 යි.)*
   (iii) ඔබ නරඹා ඇති නූතන යථාර්ථවාදී නාට්‍යයක සාර්ථක - අසාර්ථක භාවය පිළිබඳ විචාරයක් කරන්න. *(ලකුණු 06 යි.)*

5. (i) එංගලන්තයේ ජනවන්දනා නාට්‍ය බිහි වීමට තුඩු දුන් හේතු සාධක සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි.)*
   (ii) ජනවන්දනා නාට්‍ය ගණයට අයත් වන නාට්‍ය ප්‍රභේද පිළිබඳ කෙටි සමාලෝචනයක් කරන්න. *(ලකුණු 05 යි.)*
   (iii) එකී නාට්‍ය මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලද ආකාරය විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*

6. (i) ෂේක්ස්පියර්ගේ නාට්‍ය අයත් වන නාට්‍ය ප්‍රභේද පිළිබඳ ව උදාහරණ සහිත ව කෙටි හැඳින්වීමක් කරන්න. *(ලකුණු 04 යි.)*
   (ii) එම ප්‍රභේද අතුරෙන් 'ඔතෙලෝ' නාට්‍යයෙන් නියෝජනය වන නාට්‍ය ප්‍රභේදයේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි.)*
   (iii) එකී නාට්‍ය නැරඹීමෙන් ප්‍රේක්ෂකයා අත්විඳින අනුභූතිය කෙබඳු ද යි සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*

※ ※ ※

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

නාට්‍ය හා රංගකලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

**57 S II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

7426

විභාග අංකය: ....................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

※ I කොටස - **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ II කොටස - **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන සංවාද / කවි / ගීත ආශ්‍රයෙන් අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රැවිය මට
ඇදුරු මට දකා නර බිල්ල ගන්නට
පැදුර පිට තැබුවා යකුට කන්නට

B - පැදුරු වියන්න කොහේ ද යන්නෙ?
ඉර හඳ පායන විලට යමු

C - අසාලා කීවෙ වගතුග සියල්ලක්
යොදලා ගන්න බොරු බස් ඇසිල්ලක්
රවාලා කීවෙ අප හට ද්වේසයක්
කපාලා දෙමිය ගමම(හ) ගෙ බරට ගාතයක්

D - ගම්බර කාලිංග දූර නිරිඳුගේ වාසල පුරයට
ඉන්න දනා සේම රජුට සෝද පටපිළී සොඳට
ඉන්න නරනා තැබුනට මට පේඩි විදනේ සත්තට
මං මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එන විට

E - රන් රඹුටන් ගස් දෙකයි - වලිකුකුළන් පස් දෙනයි
උන්ට කන්ට බත් දෙන කොට - අපිත් එක්ක ලස්සනයි

The National e-learning Portal for The General Education

1. සන්නියකුමට හා කොහොඹා කංකාරියට අයත් පද්‍ය කාණ්ඩ වන්නේ
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) C හා D ය. (5) A හා D ය. (......)

2. ශාන්තිකර්මවල ආභාසයක් ප්‍රකට **නොකරන** පද්‍යය වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. (......)

3. විනෝදස්වාදය ලබාදීමේ අරමුණින් ඉදිරිපත් කෙරෙන පද්‍ය වන්නේ
(1) A හා C ය. (2) A හා D ය. (3) C හා D ය. (4) B හා E ය. (5) D හා E ය. (......)

4. වෙස්මුහුණු සහිත ව ඉදිරිපත් කෙරෙන නර්තනාංග නියෝජනය කරන පද්‍ය කාණ්ඩය කුමක් ද?
(1) ABD (2) ACD (3) ADE (4) ABE (5) CDE (......)

5. විශේෂ හේතුවක් සඳහා පෞද්ගලික ව සංවිධානය කෙරෙන ශාන්තිකර්මය නියෝජනය කරන පද්‍යය වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. (......)

[ දෙවෙනි පිටුව බලන්න.

- පහත දක්වෙන ප්‍රකාශ ඇසුරින් අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පත්තිනි සංකල්පය හා බැඳී ඇතැයි සැලකේ.
B - විචිත්‍ර වූ වෙස්මුහුණු භාවිත කරනු ලැබේ.
C - ගැමියා විසින් ප්‍රභූ පන්තිය සරදමට ලක් කරනු ලැබේ.
D - නාට්‍යය රඟ දක්වෙන ස්ථානය 'තානායම්පොළ' නමින් හැඳින්වේ.
E - ගැටබෙරය හා කයිතාලම වාද්‍ය භාණ්ඩ ලෙස භාවිත කෙරේ.
F - සශ්‍රීකත්වය හා සෞභාග්‍යය අරභයා රඟදක්වනු ලැබේ.
G - සමහර නළුවෝ පමණක් සරල ව සාදගත් වෙස්මුහුණු පළඳිති.
H - රංගභූමියේ වෙස් අත්තක් භාවිත කරනු ලැබේ.

6. උඩරට ප්‍රදේශයට ආවේණික ජන නාට්‍යයට අදාළ කරුණු ඇතුළත් වන කාණ්ඩය තෝරන්න.
(1) ABCD (2) ACDE (3) BCDG (4) AEFG (5) CDFG (......)

7. ලංකාවේ බටහිර හා දකුණු වෙරළබඩ පළාත්වල ප්‍රචලිත ජනනාට්‍ය ප්‍රභේදයට අදාළ කරුණු ඇතුළත් වන කාණ්ඩය තෝරන්න.
(1) ABDE (2) BCDH (3) BDGH (4) ACDG (5) BDGH (......)

- පහත දක්වෙන තොරතුරු ඇසුරින් අංක 8 සිට 11 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සේරිමාන් රජ
B - පත්තිනි දේවිය
C - මැණික්පාල බිසොව
D - වඩිග පටුන
E - මංගර සමයම
F - අඹ විදමන
G - ගුරුගේ මාලාව
H - කපු යක්කාරිය
I - පිච්චමල් බිසොව
J - දර්පණ යක්කම

8. රිද්දියාගය හා සම්බන්ධ චරිත / නාට්‍යමය අවස්ථා වන්නේ
(1) G හා D ය. (2) I හා H ය. (3) E හා H ය. (4) A හා J ය. (5) A හා B ය. (......)

9. කොහොඹාකංකාරියට අයත් පෙළපාළි වන්නේ
(1) G හා J ය. (2) G හා C ය. (3) J හා E ය. (4) C හා F ය. (5) B හා H ය. (......)

10. පහන් මඩුව හා සම්බන්ධ වන්නේ
(1) A හා I ය. (2) I හා H ය. (3) A හා B ය. (4) E හා F ය. (5) B හා H ය. (......)

11. සූනියම් යාගය හා සම්බන්ධ වන්නේ
(1) A හා I ය. (2) C හා D ය. (3) B හා I ය. (4) A හා B ය. (5) H හා I ය. (......)


- පහත දක්වෙන ප්‍රකාශ ආශ්‍රයෙන් අංක 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රාත්‍රියේ ආරම්භ ව පසු ද පහන් වන තුරු නාට්‍යය රඟ දැක්විණි.
B - උත්තර භාරතීය සංගීතයෙන් පෝෂණය වී ය.
C - නාට්‍යශාලා තුළ රඟ දැක්විණි.
D - ක්‍රිස්තු භක්තිකයන් අතින් ද බෞද්ධ තේමා සහිත නාට්‍ය රචනා වී ඇත.
E - ස්ත්‍රී චරිත රඟපාන ලද්දේ පිරිමි නළුවන් විසිනි.
F - ස්ත්‍රීහු ද රංගනයට අවතීර්ණ වූහ.
G - සංගීතය රංගනය හා අතිශයින් බද්ධ වී ඇත.
H - රංගනය යට වී සංගීතය ඉස්මතු වී ඇත.

12. නාඩගමට අදාළ ප්‍රකාශ වනුයේ
(1) A, C, H හා I ය. (2) B, C, D හා E ය. (3) A, D, E හා G ය.
(4) C, D, G හා H ය. (5) A, C, F හා H ය. (......)

13. නූර්තියට අදාළ ප්‍රකාශ වනුයේ
(1) C, D, G හා H ය. (2) B, C, F හා H ය. (3) A, C, D හා G ය.
(4) B, C, F හා G ය. (5) A, C, F හා G ය. (......)

● පහත දක්වෙන රූපය පැරණි සංස්කෘත ප්‍රේක්ෂාගාරයක බිම් සැලැස්මකි. එය ආශ්‍රයෙන් අංක **14** සිට **16** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




14. ප්‍රධාන රංගපීඨය වූයේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. (……)

15. සංස්කෘත ප්‍රේක්ෂකාගාරයේ තිරය
(1) A හා B අතර යොදා තිබුණි. (2) B හා D අතර යොදා තිබුණි.
(3) B හා C අතර යොදා තිබුණි. (4) C හා E අතර යොදා තිබුණි.
(5) නො යොදා තිබුණි. (……)

16. 'D' අකුරෙන් දක්වෙන ස්ථානය යොදා ගනු ලැබුයේ
(1) අතිරේක රංග භූමියක් වශයෙනි.
(2) පෙළ මතක් කර දෙන්නන් සිටුවා තැබීම සඳහා ය.
(3) ප්‍රාසාද වැනි උස් ස්ථාන නිරූපණය කිරීම සඳහා ය.
(4) රාත්‍රි දර්ශනවලදී වේදිකාවට ආලෝක සැපයූ පහන් තැබීම සඳහා ය.
(5) ගායක හා වාදක මණ්ඩලයට හිඳගැනීම සඳහා ය. (……)

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පිළිතුර තෝරන්න.

17. ග්‍රීක ට්‍රැජඩියක ප්‍රධාන ලක්ෂණ වනුයේ :
(1) නාට්‍ය වස්තුව පශ්චාද් දෘෂ්ටි කථන ස්වරූපයෙන් ගොඩනගනු ලැබ තිබීම
(2) නායකයා ආදර්ශවත් චරිතයක් වුව ද ඔහු අතින් සිදුවන කිසියම් වරදක් නිසා ඛේදාන්ත ඉරණමකට ගොදුරු වීම
(3) සියලු ම සිද්ධි කාලානුරූප ව හා තර්කානුකූල ව ගොඩනගනු ලැබ තිබීම
(4) සාමාන්‍යයෙන් ගානවෘන්දය හා නළුවන් සඳහා වෙනම රංගස්ථල දෙකක් වෙන් වී තිබීම
(5) සම්පූර්ණ නාට්‍යය ම තනිකර පද්‍යයෙන් රචනා වී තිබීම (……)

18. අභිඥානශාකුන්තලය :
(1) පද්ම පුරාණයේ එන කථාවක් මත පදනම් වී ඇත.
(2) දුර්වාසස්ගේ ශාපය කාලිදාසගේ ම නිර්මාණයකි.
(3) නාට්‍යයේ ප්‍රධාන තේමාව වනුයේ දුෂ්‍යන්ත හට සිය පුතු සමු වීම ය.
(4) නාට්‍යයට එම නම ලැබී ඇත්තේ එක්තරා සිහිවටන වස්තුවක් එහි ප්‍රධාන තැනක් ගන්නා නිසා ය.
(5) ශකුන්තලා හැදූණු වැඩුණු අසපුවේ කුලපති කණ්ව තවුසා 'කාශ්‍යප' නමින් ද හැඳින්වේ. (……)

19. ඇන්ටගනී නාට්‍යය:
(1) ඇන්ටිගනී නාට්‍යයේ නායිකාව ඊඩිපස් රජුගේ දෙටු දියණියෝ ය.
(2) මෙම නාට්‍යයේ නායිකාවගේ මාමා වන ක්‍රෙයොන් රජු වූයේ සිහසුන පැහැර ගැනීමෙනි.
(3) 'ඊඩිපස් රජ', 'තීබයට එරෙහිව සත් දෙනෙක්' හා 'ඇන්ටිගනී' යන නාට්‍ය එක ම පුරාවෘත්තයකට අයත් වෘත්තාන්ත තුනක් මත පදනම් වී ඇත.
(4) 'ඇන්ටිගනී' නාට්‍යය අවසානයේ නායකයා මිය නොගිය ද, අන් සැම අතින් ම පරාජයට පත් වූවෙකි.
(5) ප්‍රධාන චරිත තමන්ගේ දැඩි තීරණ වෙනස් නොකිරීම ඔවුනට අත්වන ඛේදජනක ඉරණමට හේතු වේ. (……)

[ හතරවෙනි පිටුව බලන්න.

7426


20. සරච්චන්ද්‍රගේ 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යය වඩාත් සමීප බවක් දක්වන්නේ
(1) භාසගේ ස්වප්නවාසවදත්ත නාට්‍යයට ය.
(2) හර්ෂගේ රත්නාවලී නාටිකාවට ය.
(3) කාලිදාසගේ මාලවිකාග්නිමිත්‍ර නාට්‍යයට ය.
(4) භාසගේ ප්‍රතිඥායෞගන්ධරායණ නාට්‍යයට ය.
(5) හර්ෂගේ ප්‍රියදර්ශිකා නාටිකාවට ය. (……)

21. ඉංග්‍රීසි නාට්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ
(1) වික්ටෝරියා මහ රැජිනගේ රාජ්‍ය කාලය යි.
(2) VI වැනි ජෝර්ජ් මහරජුගේ රාජ්‍ය කාලය යි.
(3) II වැනි එලිසබෙත් මහ රැජිනගේ රාජ්‍ය සමය යි.
(4) VIII වැනි හෙන්රි රජුගේ රාජ්‍ය සමය යි.
(5) I වැනි එලිසබෙත් මහරැජිනගේ රාජ්‍ය කාලය යි. (……)

22. ඉංග්‍රීසි නාට්‍යයේ ස්වර්ණමය යුගයට අයත් නාට්‍යකරුවන් වනුයේ
(1) ජෝන් ගැල්ස්වර්දි, ෂෙරිඩන් හා චෝසර් ය.
(2) සමර්සෙට් මෝහම්, බර්නාර්ඩ් ෂෝ හා බෙන් ජොන්සන් ය.
(3) තෝමස් කයිඩ්, ක්‍රිස්ටෝෆර් මාර්ලෝ හා විලියම් ෂේක්ස්පියර් ය.
(4) විලියම් ෂේක්ස්පියර්, හැරල්ඩ් පින්ටර් හා ඔස්කාර් වයිල්ඩ් ය.
(5) විලියම් ෂේක්ස්පියර්, සැමුවෙල් බෙකට් හා බර්නාර්ඩ් ෂෝ ය. (……)

23. නෝ නාට්‍යයක ප්‍රධාන නළුවා හැඳින්වෙන්නේ
(1) වකි යනුවෙනි. (2) ෂිතෙ යනුවෙනි. (3) කොකතා යනුවෙනි.
(4) ෂිතෙත්සුරෙ යනුවෙනි. (5) වකිත්සුරෙ යනුවෙනි. (……)

24. දකුණු පස රූපයෙන් දැක්වෙන්නේ
(1) කබුකි රඟහලකි.
(2) සංස්කෘත ප්‍රේක්ෂාගෘහයකි.
(3) එලිසබෙතීන රඟහලකි.
(4) නෝ රඟහලකි.
(5) නූතන ප්‍රොසීනියම් වේදිකාව සහිත රඟහලකි. (……)



- පහත සඳහන් වගුව ආශ්‍රයෙන් අංක **25** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **නාට්‍ය රචක** | **නාට්‍යකෘතියේ නම** | **සිංහල පරිවර්තනයේ නම** | **සිංහල නිෂ්පාදකයාගේ නම** |
|---|---|---|---|
| ලුයිජි පිරාන්ඩෙලෝ | Six characters in search of an author | A | B |
| C | Mother Courage | දිරිය මව සහ ඇගේ දරුවෝ | D |
| E | Miss Julie | යූලි | මංගල සේනානායක |
| හෙන්රික් ඉබ්සන් | The Wild Duck | වන තාරාවී | F |

25. ඉහත **A** අකුරෙන් හැඳින්වෙන්නේ
(1) හිත හොඳ අම්මණ්ඩි ය. (2) හෙලේ නැඟ්ග ඩෝං පුතා ය. (3) හරිම බඩු හයක් ය.
(4) වෙස් මුහුණු ය. (5) බර්නාදා ගේ සිපිරි ගේ ය. (……)

26. **B** අකුරෙන් හැඳින්වෙන්නේ
(1) ධර්මසිරි බණ්ඩාරනායක ය. (2) ජයලත් මනෝරත්න ය. (3) හෙන්රි ජයසේන ය.
(4) සුගතපාල ද සිල්වා ය. (5) ඩග්ලස් සිරිවර්ධන ය. (……)

27. **C** අකුරෙන් දැක්වෙන්නේ
(1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය. (2) ටෙනසි විලියම්ස් ය. (3) ඉයුජින් ඕ නීල් ය.
(4) අයනෙස්කෝ ය. (5) ෂොන් පෝල් සාත්‍රේ ය. (……)

[ පස්වෙනි පිටුව බලන්න.

28. D අකුරෙන් දැක්වෙන්නේ
(1) සුගතපාල ද සිල්වා ය.    (2) ගුණසේන ගලප්පත්ති ය.    (3) හෙන්රි ජයසේන ය.
(4) ධර්මසිරි බණ්ඩාරනායක ය.    (5) බන්දුල විතානගේ ය.    (……)

29. E අකුරෙන් දැක්වෙන්නේ
(1) හෙන්රික් ඉබ්සන් ය.    (2) ඉයුජීන් අයෙනෙස්කෝ ය.    (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
(4) ඔගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් ය.    (5) ඇන්ටොනින් ආර්තො ය.    (……)

30. F අකුරෙන් දැක්වෙන්නේ
(1) බන්දුල විතානගේ ය.    (2) බන්දුල ජයවර්ධන ය.    (3) අර්නස්ට් මැකින්ටයර් ය.
(4) එම්. සෆීර් ය.    (5) ඊ. එම්. ඩී. උපාලි ය.    (……)

31. A - කාලිදාස
B - ඇරිස්ටොෆනීස්
C - ඇන්ටන් චෙකොෆ්
D - විලියම් ෂේක්ස්පියර්
E - බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්

ඉහත නම් සඳහන් නාට්‍යකරුවන් කාලානුරූපී ව පෙළගැස්විය හැක්කේ
(1) ABCDE ලෙස ය.    (2) BADCE ලෙස ය.    (3) ADBEC ලෙස ය.
(4) ABEDC ලෙස ය.    (5) BADEC ලෙස ය.    (……)

- පහත සඳහන් මාතෘකා ඇසුරෙන් අංක **32** සිට **36** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - එක්කුක්ලීමා    B - කුටිල දණ්ඩ
C - කොඩේගු    D - කොතුර්නොස්
E - ඊගස    F - මෝල්ගහ
G - ඔදේගු    H - පැන් කෙණ්ඩිය
I - දෙකොන විලක්කුව    J - කුල්ල

32. ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වන්නේ
(1) D හා H ය.    (2) A හා E ය.    (3) A හා D ය.    (4) A හා C ය.    (5) B හා D ය.    (……)

33. සංස්කෘත නාට්‍යය හා සම්බන්ධ වන්නේ
(1) B හා E ය.    (2) B හා H ය.    (3) H හා I ය.    (4) B හා I ය.    (5) E හා H ය.    (……)

34. ජපාන නාට්‍ය හා සම්බන්ධ වන්නේ
(1) C හා G ය.    (2) A හා C ය.    (3) A හා G ය.    (4) C හා J ය.    (5) A හා E ය.    (……)

35. සන්නියකුම හා සම්බන්ධ වන්නේ
(1) B හා E ය.    (2) E හා F ය.    (3) F හා I ය.    (4) E හා I ය.    (5) B හා I ය.    (……)


36. සොකරි නාට්‍යය හා සම්බන්ධ වන්නේ
(1) E හා F ය.    (2) F හා I ය.    (3) F හා J ය.    (4) B හා J ය.    (5) B හා F ය.    (……)

37. සෑම නාට්‍ය සම්ප්‍රදායක ම ඊට ආවේණික වූ නාට්‍ය ප්‍රභේද දක්නට ලැබේ. ෂේක්ස්පියර්ගේ නාට්‍ය අයත් වන්නේ පහත දැක්වෙන කවර නාට්‍ය ප්‍රභේද ගොනුවට ද?
(1) ශෝකාන්ත, සුඛාන්ත, සටුර    (2) ශෝකාන්ත, සුඛාන්ත, ප්‍රහසන
(3) ශෝකාන්ත, සුඛාන්ත, ඓතිහාසික    (4) ශෝකාන්ත, ඓතිහාසික, ප්‍රහසන
(5) සුඛාන්ත, ඓතිහාසික, ප්‍රහසන    (……)

38. ෂේක්ස්පියර්ගේ 'ජුලියස් සීසර්' නාට්‍යය අයත් වන්නේ කවර වර්ගයට ද?
(1) ශෝකාන්ත    (2) සටුර    (3) සුඛාන්ත
(4) ඓතිහාසික    (5) ප්‍රහසන    (……)

39. 'ජුලියස් සීසර්' නාට්‍යයේ නායකයා කවරෙක් ද?
(1) ජුලියස් සීසර්    (2) මාර්ක් ඇන්ටනී    (3) ඔගස්ටස් සීසර්
(4) බෲටස්    (5) කැසියස්    (……)

40. දකුණු පස ඡායාරූපයෙන් දැක්වෙන්නේ
(1) ධාරා පහනෙකි.
(2) ප්‍රොෆයිල් යොමු පහනෙකි.
(3) අනුගාමී යොමු පහනෙකි.
(4) ෆ්‍රෙස්නල් යොමු පහනෙකි.
(5) ස්ට්‍රෝබ් පහනෙකි.    (……)



* *

The National e-learning Portal for The General Education